IHRA
UNIVERSITY OF COLOMBO

194

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස

## ප්‍රථම සෙමෙස්තරය - 2017/18

(පවත්වන ලද්දේ 2020 පෙබරවාරි)

## BLE 103 - ලේඛකත්වය හා සන්නිවේදනය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.
(I කොටස හා II කොටස)

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02 ක් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න දහයකින් (10) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## 1 කොටස

1. සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංග කවරේදැයි සුදුසු රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

2. මානව සන්නිවේදන ඉතිහාසයේ ලේඛන යුගය වැදගත් වන ආකාරය විස්තර කරන්න.

3. <u>එක්කෝ</u>
සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් භාෂණය හා ලේඛනය අතර පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න .
<u>නැතහොත්</u>
'සිංහල භාෂණය ලේඛනයට ගත හැකි ය.' මේ මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

4. ප්‍රවෘත්ති රචනය පිළිබඳ 'යටිකුරු පිරමිඩ ආකෘතිය' ඇසුරින් පහත සඳහන් ප්‍රවෘත්ති වාර්තාව විවරණය කොට සුදුසු සිරස්තලයක් යොදන්න.

> බදුල්ල, හාලිඇල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල ගැටලුවට විසඳුමක් ලෙස ඇරඹූ ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අද (17) පෙරවරුවේ විවෘත කෙරිණ.
>
> ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා පිරිපහදු කරන ලද පානීය ජලය සම්පාදනය මෙම ව්‍යාපෘතියේ අරමුණ යි. වර්තමාන හා අනාගත ජල අවශ්‍යතා සපුරාලීම සඳහා නළ ජල පහසුකම් ලබාදීම මගින් එම ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය සහ ජීවන මට්ටම ඉහළ නැංවීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණකි.
>
> මෙම ව්‍යාපෘතිය මගින් ඇටම්පිටිය, ඌව මහවෙලගම, කොස්ලන්ද, දෙහිවින්න, හින්නාරන්ගොල්ල, නිලිඅතුගොඩ, කුඩුමහුවෙල, තෙළුව, පල්ලෙගම, මාලිගාතැන්න, වැපස්සාවෙල, කටුගහ යන ග්‍රාම නිලධාරී වසම් 12ක ජනතාව වෙනුවෙන් පානීය ජල පහසුකම් සැපයේ.

(දිනමිණ, 2020 – 2 – 17)

5. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

(අ) පුද්ගලාන්තර සන්නිවේදනය
(ආ) භාෂා ද්විරූපතාව
(ඇ) ගුවන් විදුලි බස
(ඈ) පුවත්පත් තීරු ලිපිය

## II කොටස

6. ' සිංහල හෝඩිය වෙනස් කළ යුතු ය' මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති යෝජනා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

7. සිංහල අක්ෂර වින්‍යාසය සම්බන්ධ රීති 10ක් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

8. නූතන සිංහලයේ දැකිය හැකි ලේඛන ප්‍රභේද <u>දෙකක්</u> පිළිබඳ විමසීමක් කරන්න.

9. උද්ධෘත භාවිතයේ දී හෝ මූලාශ්‍රය දැක්වීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

(අ) මිශ්‍ර සිංහල හෝඩිය
(ආ) න - ණ - ල - ළ භේදය
(ඇ) පාරිභාෂික පද
(ඈ) අක්ෂර වින්‍යාසයේ 'පොදු වැරදි'